




1. 


ඉහත රූපවලින් පෙන්වා ඇති සතුන් පස්දෙනා අතුරෙන් දෙදෙනෙකු පමණක් පොදු ලක්ෂණයක් අනුව එක් කාණ්ඩයකට වෙන් කළ හැකි ය. එම සතුන් දෙදෙනා වනුයේ,


(1) A හා C ය. (2) B හා D ය. (3) D හා E ය.

2. 

ඉහත රූප අයත් කාණ්ඩයට වඩාත් ගැළපෙන රූපය කුමක් ද?

(1)  (2)  (3) 

3. පහත දී ඇති රූපසටහනේ ? ඇති තැනට ආ යුතු සංඛ්‍යාව කුමක් ද?




(1) 20 (2) 24 (3) 32

4. පාසලේ බිමක සලකුණු කළ සමචතුරස්‍රයක ශීර්ෂ තුනක අනිල්, විමල් සහ කමල් සිටගෙන සිටින්නේ අනිල්ට උතුරු දෙසින් විමල් ද විමල්ට බටහිර දෙසින් කමල් ද වන පරිදි ය. කමල් සිටින්නේ අනිල්ට කුමන දෙසින් ද?

(1) ගිනිකොන (2) නිරිත (3) වයඹ

5. SCHOOL සහ CLASS යන වචන දෙකෙහිම ඇති නමුත් MUSIC යන වචනයෙහි නොමැති ඉංග්‍රීසි අකුරු කීයක් තිබේ ද?

(1) 1 (2) 2 (3) 3

6. සෙල්ලම් ගෙය හරි අගනා – ඉස්කෝලෙකි දැනුම දෙනා
ඉගෙන ගන්න වැඩ තියෙනා – සතුට පිරුණු තැනකි මනා

මෙම කවියෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(1) සෙල්ලම් ගෙයක් (2) පාසලක් (3) ඉගෙනීමට ඇති වැඩ

7. සුනිල් ළඟ රුපියල් 1 කාසියක් හා රුපියල් 10 කාසියක් ද නිමල් ළඟ රුපියල් 2 කාසියක් හා රුපියල් 5 කාසියක් ද ඇත. සුනිල්ගෙන් නිමල්ට ලබාදිය නොහැකි මුදල් ප්‍රමාණයක් වන්නේ,

(1) රුපියල් 5 කි. (2) රුපියල් 6 කි. (3) රුපියල් 7 කි.

8. පවුලක බාලම ගැහැනු ළමයාට සහෝදරයෝ තුන් දෙනෙක් සහ සහෝදරියෝ දෙදෙනෙක් සිටිති. එම පවුලේ වැඩිමහල්ම පිරිමි ළමයාට සිටින සහෝදරයින් ගණන සහ සහෝදරියන් ගණන පිළිවෙලින්,

(1) 2 සහ 3 කි. (2) 3 සහ 2 කි. (3) 3 සහ 3 කි.

Scanned with CamScanner


9. එක ළඟ පිහිටි මාස හතරකට තිබිය හැකි වැඩිම දින ගණන කීය ද?


(1) 122 (2) 123 (3) 124

10. එක්තරා මාසයක 6 වෙනිදා, 15 වෙනිදා සහ 20 වෙනිදා අතුරෙන් දින දෙකක් ඉරිදාවල් වේ. 6 වන දිනය වනුයේ,

(1) අඟහරුවාදා ය. (2) බදාදා ය. (3) බ්‍රහස්පතින්දා ය.

11. මේසයක් මත ඇති භාණ්ඩ කිහිපයක් පහත පෙට්ටිය තුළ දැක්වේ. එහි A අනුව ඇති පැත්තෙන් බැලූ විට පෙනෙන ආකාරය කුමක් ද?







(1) (2) (3)

12. සමන් හා පන්තියේ මිතුරන් කිහිප දෙනෙකු සමඟ ගසකින් වෙරළු ගෙඩි 172ක් කඩාගෙන පන්තියේ අනෙක් සෑම ළමයෙකුටම එම ගෙඩි 5 බැගින් බෙදා දුන් විට තවත් වෙරළු ගෙඩි 12ක් ඉතුරු විය. සමන්ගේ පන්තියේ සිටින මුළු ළමයින් ගණන කීය ද?

(1) 32 (2) 35 (3) 36


13.





ඉහත සඳහන් රූපයේ ? ඇති තැනට සුදුසු කොටස කුමක් ද?


(1)  (2)  (3) 


14. පහත රූපයේ දැක්වෙන්නේ ඊතලවලින් පෙන්වා ඇති දිශාවට කරකැවෙන ලෙස පටි යෙදූ රෝද තුනක් ඇටවුමකි. A රෝදය වට 4ක් කරකැවෙන විට B රෝදය වට 3ක් ද C රෝදය වට 6ක් ද කරකැවේ.




ඉහත රූපයේ පිහිටීමේ සිට A රෝදය එක් වටයක් කරකැවූ විට රෝදවල පිහිටීම නිවැරදිව දක්වා ඇත්තේ කුමන පටහනේ ද?

A B C

(1)


A B C

(2)

A B C

(3)

15. ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ළමයින් 12 දෙනෙකු අතුරෙන් 6 දෙනෙක් I පත්‍රයට ලකුණු 70 ට වැඩියෙන් ලබාගත්හ. 8 දෙනෙක් II පත්‍රයට ලකුණු 70 ට වැඩියෙන් ලබාගත්හ. මෙම සෑම ළමයෙකුම අවම වශයෙන් එක් පත්‍රයකවත් ලකුණු 70 ට වඩා ලබා ඇත්නම්, පත්‍ර දෙකටම ලකුණු 70 ට වඩා වැඩියෙන් ලැබූ ළමයින් ගණන කීය ද?

(1) 2 (2) 4 (3) 6


16. A, B, C සහ D ලෙස නම් කළ බර කිරීම් තරාදි මත තැබූ ආකාරය පහත රූපසටහන්වල දැක්වේ



ඒ අනුව බර අඩුම පෙට්ටියේ සිට බර වැඩිම පෙට්ටිය තෙක් අනුපිළිවෙළ කුමක් ද?

(1) C, A, B, D (2) C, B, A, D (3) D, B, C, A

17. සම ත්‍රිකෝණයකින් කපාගත් කැබලි පහක් පහත දැක්වේ



A B C D E

පහත දී ඇති කුමන කැබලි තුන එකිනෙකට යාබදව තැබීමෙන් සමද්විපාද ත්‍රිකෝණයක් සෑදිය හැකි ද?

(1) A, B, D (2) A, C, D (3) A, C, E

18. රූපයේ දැක්වෙන්නේ ඝනක හැඩැති ලී කුට්ටියකින් කොටසක් ඉවත් කළ පසු ඉතිරි කොටසයි. එහි මුහුණත් ගණන කීය ද?



(1) 3
(2) 6
(3) 9


19. මිනිත්තු දඬු කැරකී දෙවතාවක් එකිනෙකට ලම්බ වන කාල පරතරය මිනිත්තු 5ක් පමණ වේ. මිනිත්තු ඔරලෝසුවේ දඬු දෙක නැවත එකිනෙකට ලම්බ වන කාලය දළ වශයෙන් කොපමණ කාලයක් ගත වේ ද?

(1) මිනිත්තු 25 (2) මිනිත්තු 30 (3) මිනිත්තු 35


20. පහත සඳහන් සිදුවීම් ඒවා සිදුවූ කාල අනුපිළිවෙළ අනුව පෙළ ගස්වන්න

A පාසල් ලබන වසර ආරම්භය
B වසර අප්‍රේල් 13 දී පාසල් නිවාඩුව දෙවැනි වාරයේ ආරම්භය අවසාන වීම
C - ශිෂ්‍යත්ව විභාගය සඳහා වෙනත් පාසලකට යාම
D - නත්තල් වසර අප්‍රේල් දෙසැම්බර් මාසයේ දිනය
E - 11 වන ශ්‍රේණියේ ජාතික මට්ටම විභාගයට පෙනී සිටීම

(1) A, D, C, B, E (2) D, A, C, B, E (3) D, A, C, E, B

21. 


ඉහත රූප පේළියේ රටාව අනුව ? ඇති තැනට ගැළපෙන රූපය කුමක් ද?




(1) (2) (3)

22. පෝලිමක මුල කෙළවරේ සිට 10 වැනියා නයනා ය. අග කෙළවරේ සිට 10 වැනියා ක්‍රිෂ්ණා ය. මේ දෙදෙනා අතර තිදෙනෙක් සිටිති. පෝලිමේ සිටින්නේ 23 දෙනකු නොවේ. පෝලිමේ කී දෙනෙක් සිටිත් ද?


(1) 15 (2) 16 (3) 17

23. රවීගේ උපන්දින උත්සවයට පැමිණෙතැයි බලාපොරොත්තු වූ මිතුරන්ට, එක් අයකුට 10 බැගින් බෙදාදීම සඳහා අවශ්‍ය පොත් රැගෙන ආ නමුත් එක් මිතුරකු නොපැමිණි බැවින් එක් අයකුට පොත් 11 බැගින් පැමිණ සිටි මිතුරන් අතර බෙදා දෙන ලදී. එවිට පොත් 3ක් ඉතුරු විය. උත්සවයට පැමිණ සිටි මිතුරන් ගණන කීය ද?

(1) 7 (2) 8 (3) 9


24. 

ඉහත කොටුව තුළ දී ඇති රූප තුනට වඩාත් ගැළපෙන රූපය කුමක් ද?



(1) (2) (3)

25. පහත A, B, C සහ D වශයෙන් දක්වා ඇත්තේ කැඩුණු බඳ පටියක කැබලි හතරකි. ඒවායේ නිවැරදි පිළිවෙළ දැක්වෙන ගැළපීම කුමක් ද?




(1) A, B, D, C (2) C, D, B, A (3) D, C, B, A



Scanned with CamScanner

**26.** මිතුරන් දෙදෙනකු තවත් මිතුරකුගේ උපන්දින උත්සවයට යෑමට පෙර කළ කතාබහක් පහත දැක්වේ.

අපි මොනවද රැගෙන යන්නේ?

(අ) ..............................

හොඳයි. එත් ඉතින්,
(ආ) ..............................

එක හොඳයි.

(ඇ) ..............................

මෙහි හිස්තැන්වලට ගැළපෙන දෙබස් කොටස් පහත දී ඇත.

A   එහෙනම් අපි පොතක් ගනිමු

B   ඇයි අපි පොතක් ගන්නෙ නැත්තෙ?

C - ඇඳුමක් හොඳ නැද්ද?

(අ), (ආ) සහ (ඇ) හිස්තැන්වලට ගැළපෙන අනුපිළිවෙළ කුමක් ද?

(1) B, A සහ C    (2) B, C සහ A    (3) C, B සහ A

**27.** සිසුහු කණ්ඩායමක් පාසල් වත්තේ ඇති පලතුරු ගස් පිළිබඳව පහත ඇති සටහන පිළියෙල කළහ.

| ගස් වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| අඹ | ○○○○○○ |
| රඹුටන් | ○○○ |
| පේර | ○○○○◐ |
| කජු | ○○○ |
| නාරං | ○○○○○ |


එම සටහනට අනුව පාසල් වත්තේ ඇති

(1) කජු ගස් සංඛ්‍යාව හරියටම තුනකි.

(2) රඹුටන් ගස් සංඛ්‍යාව අඩුම වශයෙන් හයකි.

(3) අඹ ගස් සංඛ්‍යාව නාරං ගස් සංඛ්‍යාවට වඩා එකක් වැඩි ය.


**28.** රූපයේ දැක්වෙන සටහනෙහි එක් එක් හිස්කොටුව 2 සිට 6 තෙක් ඉලක්කම්වලින් සම්පූර්ණ කළ යුත්තේ එක් එක් ඉලක්කම එක්වරක් පමණක් යෙදෙන ලෙසත්, සෑම කොටසක ඇති ඉලක්කම්වල එකතුව 15 වන ලෙසත් ය. ඒ අනුව 8 අයත් කොටසේ කොටුවක ඇති ඉලක්කමක් වනුයේ.




(1) 4 ය.    (2) 5 ය.    (3) 6 ය.


**29.** මුලින් දී ඇති විනිවිද පෙනෙන කඩදාසිය තිත් ඉර දිගේ නැමූ විට ලැබෙන රූපය කුමක් ද?





(1)    (2)    (3)

**30.** එකම ප්‍රමාණයේ ඝනක එකතු කොට සාදන ලද ඝන වස්තුවක් දෙස ඉදිරියෙන් බැලූ විට පෙනුම සහ පසුපසින් බැලූ විට පෙනුම පහත දැක්වේ. මෙම ඝන වස්තුව සකස් කිරීම සඳහා ඝනක කීයක් යොදාගෙන තිබේ ද?



(1) 11

(2) 13

(3) 16

Scanned with CamScanner

31. පෙ.ව. 7.00ට ගමන් ආරම්භ කළ දුම්රියක් මල්වත්ත දුම්රිය ස්ථානය පසු කිරීමෙන් මිනිත්තු 30 කට පසු කුරුඳුවත්ත දුම්රිය ස්ථානය පසු කළේ ය. ඉන් හරියටම පැයකට පසු තල්වත්ත දුම්රිය ස්ථානයට ළඟා විය. අනතුරුව තල්වත්ත දුම්රිය ස්ථානයෙන් පෙ.ව. 10.00ට ආපසු ගමන් අරඹා කුරුඳුවත්ත සහ මල්වත්ත දුම්රිය ස්ථාන පසුකර නැවත ආරම්භක ස්ථානයට ළඟා විය. මෙම දුම්රිය මුළු ගමනේදීම එකම වේගයකින් ධාවනය වූයේ නම් එම දුම්රිය පිළිබඳව පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදි විය හැකි ද?

(1) පෙ.ව. 7.30ට කුරුඳුවත්ත දුම්රිය ස්ථානය පසු කළේ ය.

(2) මල්වත්ත දුම්රිය ස්ථානය පසු කළේ පෙ.ව. 11.00ට ය.

(3) ආරම්භක ස්ථානයට නැවත ළඟා වූයේ ප.ව. 12.30ට ය.

32. ※ දේදුන්නක් දැකිය හැකි වන්නේ වැසි දිනයක පමණි.

※ වැසි සහිත සමහර දිනවල දේදුනු දැකිය හැකි ය.

ඉහත ප්‍රකාශ දෙක අනුව පහත සඳහන් ඒවායින් කුමක් සත්‍ය විය හැකි ද?

(1) වැසි සහිත සෑම දිනයකම දේදුන්නක් දක්නට ලැබේ.

(2) වැසි රහිත දිනයක වුවද දේදුන්නක් දක්නට ලැබිය හැකි ය.

(3) වැසි සහිත දිනයක වුවද දේදුන්නක් දක්නට නොලැබිය හැකි ය.

33. ශාන්ත උදේ 7.00ට තම නිවසින් පිටත්ව ඒකාකාර වේගයකින් අරුණගේ නිවස තෙක් ගොස් එහි නොනැවතී එම වේගයෙන්ම ආපසු පැමිණෙයි. අරුණ ද උදේ 7.00ට තම නිවසින් පිටත්ව ඒකාකාර වේගයකින් ශාන්තගේ නිවස තෙක් ගොස් එහි නොනැවතී ආපසු පැමිණෙයි. දෙදෙනාම ගමන් කළේ එකම මාර්ගයක ය. දෙදෙනාගේ නිවෙස් අතර දුර මීටර 600කි. අරුණගේ වේගය ශාන්තගේ වේගය මෙන් දෙගුණයකි. මෙම ගමනේදී දෙදෙනා හමුවන ස්ථානවලට ශාන්තගේ නිවසේ සිට ඇති දුර මීටර

(1) 200ක් සහ 400කි. (2) 200ක් සහ 600කි. (3) 400ක් සහ 600කි.

34. වැසි දිනයේ නොපැමිණි සියලුම සිසුහු බස් රථයෙන් පාසලට පැමිණෙන අය වෙති. ඒ අනුව

(1) බස් රථයෙන් නොපැමිණෙන සියලුම සිසුහු එදින පාසලට පැමිණ සිටිති.

(2) බස් රථයෙන් පැමිණෙන එක් සිසුවකු හෝ එදින පාසලට පැමිණ ඇත.


(3) බස් රථයෙන් පැමිණෙන කිසිදු සිසුවකු එදින පාසලට පැමිණ නැත.

35. සෑම ශීර්ෂයකටම එක් තිතක් (•) තිබෙන පරිදි මෙම සටහනෙහි තිත් යා කර ඇඳිය හැකි සමචතුරස්‍ර ගණන කීය ද?

(1) 2

(2) 3

(3) 4



[අටවැනි පිටුව බලන්න.

**36.** පහත දැක්වෙන්නේ 'ගගන' සිනමාශාලාවේ ප්‍රදර්ශනය කෙරෙන චිත්‍රපටි පිළිබඳ දැන්වීමකි.

| දිනපතා ප්‍රදර්ශනය කෙරේ. | |
|---|---|
| රිදී ඉරක් | පෙ.ව. 10.00<br>ප.ව. 2.00 |
| සුපුන් සඳක් | ප.ව. 6.00<br>ප.ව. 9.00 |

මෙම තොරතුරු අනුව පහත සඳහන් කුමක් නිගමනය කළ හැකි වේ ද?

(1) සුපුන් සඳක් චිත්‍රපටියේ දෙවන දර්ශනය මධ්‍යම රාත්‍රි 12.00 ට පෙර අවසන් වේ.

(2) වඩා අඩු දර්ශන කාලයක් ඇත්තේ සුපුන් සඳක් චිත්‍රපටියටයි.

(3) රිදී ඉරක් චිත්‍රපටියේ දර්ශන වාරයක් පැය තුනකට වඩා වැඩි ය.


**37.** අමාලි අසනීපව වෛද්‍යවරයකු වෙත ගිය විට ඇයට බෙහෙත් පෙති 10ක් දී පැය 5කට වරක් එක පෙත්ත බැගින් බොන ලෙස නියම කෙරිණි. ඇය සඳුදා පෙ.ව. 10.00 ට බෙහෙත් පෙති බීම ඇරඹුවේ නම්, ඇයට අවසාන බෙහෙත් පෙත්ත බීමට සිදු වන්නේ

(1) අඟහරුවාදා පෙ.ව. 7.00 ට ය.

(2) බදාදා පෙ.ව. 7.00 ට ය.

(3) බදාදා මධ්‍යාහ්න 12.00 ට ය.

**38.** අමල්, කමල් සහ විමල් යන සිසුන් තිදෙනාත් ආශා, බාමිනි සහ චිත්‍රා යන සිසුවියන් තිදෙනාත් රූපයේ දැක්වෙන පරිදි සෘජුකෝණාස්‍ර මේසයක් වටා ඇති ආසනවල මේසය දෙසට මුහුණලා වාඩිවී සිටින්නේ පහත දැක්වෙන පරිදි ය.




* සෑම සිසුවකුටම මුහුණලා වාඩිවී සිටින්නේ සිසුවියකි.
* අමල් දෙපසින්ම සිටින්නේ සිසුවියන් ය.
* ආශා දෙපසින්ම සිටින්නේ සිසුන් ය.
* බාමිනිගේ වමපසින් අමල් ද දකුණු පසින් චිත්‍රා ද සිටිති.

ඒ අනුව, ආශාට මුහුණලා **නොසිටිය** හැක්කේ කවුරුන් ද?

(1) අමල්    (2) කමල්    (3) විමල්

**39.** A, B, C යනු පිළිවෙළින් රතු, කහ සහ කොළ පැහැති විදුලි බුබුළු තුනකි. ඒ එක් එක් බල්බය දැල්වී තිබීම හෝ නිවී තිබීම හෝ මගින් එකිනෙකට වෙනස් සංඥා ඉදිරිපත් කළ හැකි ය. එසේ ඉදිරිපත් කළ හැකි මුළු සංඥා ගණන කීය ද?




(1) 3    (2) 6    (3) 8

**40.** ළමයින් නවදෙනකු අතුරින් දෙදෙනෙක් කළු පාට කුඩ ද තිදෙනෙක් නිල් පාට කුඩ ද හතරදෙනෙක් රතු පාට කුඩ ද ඉහළාගෙන පේළියට සිටගෙන සිටිති. රතු පාට කුඩයක් ඉහළාගෙන සිටින සෑම ළමයකු දෙපසම සිටින දෙදෙනා ඉහළාගෙන ඇත්තේ කළු පාට කුඩයක් හා නිල් පාට කුඩයකි. පේළිය හරි මැද සිටින ළමයා ඉහළාගෙන සිටින්නේ මොන පාට කුඩයක් ද?

(1) කළු    (2) නිල්    (3) රතු

***

Scanned with CamScanner

# 2026 ශිෂ්‍යත්ව විභාගය

## 01 කොටස - පිළිතුරු පත්‍රය

( පිළිතුරු සංශෝධනය විය හැක .)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ① | ❷ | ③ | 21. | ① | ② | ❸ |
| 2. | ① | ② | ❸ | 22. | ❶ | ② | ③ |
| 3. | ① | ❷ | ③ | 23. | ❶ | ② | ③ |
| 4. | ① | ② | ❸ | 24. | ❶ | ② | ③ |
| 5. | ❶ | ② | ③ | 25. | ① | ② | ❸ |
| 6. | ❶ | ② | ③ | 26. | ① | ② | ❸ |
| 7. | ① | ② | ❸ | 27. | ① | ❷ | ③ |
| 8. | ❶ | ② | ③ | 28. | ❶ | ② | ③ |
| 9. | ① | ❷ | ③ | 29. | ① | ② | ❸ |
| 10. | ❶ | ② | ③ | 30. | ① | ② | ❸ |
| 11. | ① | ❷ | ③ | 31. | ① | ② | ❸ |
| 12. | ① | ② | ❸ | 32. | ① | ② | ❸ |
| 13. | ① | ❷ | ③ | 33. | ❶ | ② | ③ |
| 14. | ① | ② | ❸ | 34. | ❶ | ② | ③ |
| 15. | ❶ | ② | ③ | 35. | ① | ❷ | ③ |
| 16. | ① | ❷ | ③ | 36. | ❶ | ② | ③ |
| 17. | ① | ❷ | ③ | 37. | ① | ❷ | ③ |
| 18. | ① | ② | ❸ | 38. | ❶ | ② | ③ |
| 19. | ❶ | ② | ③ | 39. | ① | ② | ❸ |
| 20. | ① | ❷ | ③ | 40. | ① | ❷ | ③ |

**1.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

පහ ශ්‍රේණියේ සිසුන් සඳහා සංවිධානය කළ අධ්‍යාපන චාරිකාව අවසානයේදී අප පැමිණියේ සත්ත්වෝද්‍යානය නැරඹීමටයි. සත්ත්වෝද්‍යානයට ඇතුළු වීමට ප්‍රථම පන්තිභාර ගුරුතුමිය ප්‍රකාශ කළේ සතුන්ව ඇල්ලීමට යෑම හෝ සතුන්ට කෑම දීම හෝ, නොකළ යුතු බවයි. සත්ත්වෝද්‍යානයට ඇතුළු වෙනවාත් සමඟ සතුන්ගේ විවිධ හඬවල් ඇසෙන්නට පටන් ගත් අතර අපි සෙමෙන් ඉදිරියට ම ගමන් කළෙමු. විවිධ වර්ණයෙන් යුත් කුරුලු වර්ග සහ මොණරුන්ගේ රංගනයන් දැකීම අපගේ සිත්වල ඇති කළේ පුදුමාකාර සතුටකි. ඉන්පසුව විසිතුරු මාළු විශේෂ සිටින මින්මැදුර ද, භයංකර හඬ නංවන සිංහයා, වලහා වැනි සතුන් සිටින ස්ථාන ද පසුකරමින් අපි අලි සෙල්ලම නැරඹීමට පැමිණියෙමු. එය ඉතා විනෝදජනක විය. චාරිකාවට සහභාගි වී සිටි දෙමාපියෝ අප සැමට වැලිතලප සහ කෙසෙල් ගෙඩි බෙදා දුන්නෝ ය. සියල්ල නිම වූ පසු දිමුත් සහ අසංක කෙසෙල් ලෙලි සියල්ල බැගයකට එකතු කිරීම සිදු කළෝ ය. සියල්ලන් බස් රථයට ගොඩවීමෙන් පසු චාරිකාව සංවිධානය කළ ගුරුතුමිය සැමට ස්තුති කළා ය. ඉන්පසු අපි සැවොම සතුටින් නිවෙස් කරා පැමිණියෙමු.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) ඉහත ඡේදයට අනුව චාරිකාව සංවිධානය කළේ කුමන ශ්‍රේණියේ සිසුන් සඳහා ද?

..................................................................................................................

(ii) සත්ත්වෝද්‍යානයට ඇතුළු වීමට ප්‍රථම පන්තිභාර ගුරුතුමිය පැවසුවේ කුමක් ද?

..................................................................................................................

(iii) සිසුන්ගේ සිත්වලට සතුටක් ඇති කළේ කුමක් දැකීමෙන් ද?

..................................................................................................................

(iv) මෙම ඡේදයේ සඳහන් භයංකර හඬ නංවන සතුන් කවුරුන් ද?

..................................................................................................................

(v) දිමුත් සහ අසංක කළේ කුමක් ද?

..................................................................................................................

(vi) 'ආරම්භයේදී' යන්නට විරුද්ධ පදයක් මෙම ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද?

..................................................................................................................

(vii) 'විචිත්‍ර' යන්නට සමානාර්ථය දෙන පදයක් මෙම ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද?

..................................................................................................................

**2.** පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා **යටින් ඉරක් අඳින්න.**

(i) අපි පිරිසිදු ජලය දිනපතා පානය ........................ (කරන්නෝ ය. / කරන්නෙමු. / කරන්නෙහු.)

(ii) ඔවුහු රූපවාහිනිය ................................ (නරඹති. / නරඹන්නේ ය. / නැරඹුවෙහි ය.)

(iii) ඌ වනයට ................................................ (දිවුවේ ය. / දිවුවෝ ය. / දුවති.)

(iv) ඈ ගෙදර වැඩ හොඳින් ........................................ (කරති. / කරයි. / කළහ.)

(v) අහසේ තරු ................................ (බැබළුණේ ය. / බැබළුණෝ ය. / බැබළෙති.)

Scanned with CamScanner

3. පහත සඳහන් එක් එක් නියමනට ගැළපෙන නාම පදය හෝ ක්‍රියා පදය හෝ කොටුව තුළින් ෙ
තිත් ඉර මත ලියන්න.

(i) අප්‍රාණවාචී ඒකවචන නාම පදයකි : ........................................................

(ii) වර්තමාන කාල බහුවචන ක්‍රියා පදයකි : ........................................................

| ගස, ඔහු, මල්, නටයි, නටති, ගියේ ය |
|---|

4. පහත සඳහන් එක් එක් වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

(i) ඔහු තම වැඩ කටයුතු ඉක්මනින් නිම කළේ ය.

........................................................................................................

(ii) කිරිල්ලී තම පැටවුන්ට කෑම දුන්නා ය.

........................................................................................................

5. පහත දැක්වෙන එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන දෙක බැගින් ඇත. එම වචන පමණක් නි
කර අදාළ තිත් ඉරි මත ලියන්න.

(i) පාසල ලඟ තිබුණු කුඩා කඩය දැන් විසාල ගොඩනැගිල්ලකි.

.................................... ....................................

(ii) අපේ ක්‍රිඩා උත්සව අවස්ථාවේ ප්‍රථමාදාර කන්ඩායම නියමිත වෙලාවට පැමිණියේ ය.

.................................... ....................................

6. එක් එක් ඉඟිවැකියට ගැළපෙන අර්ථය පහත කොටුව තුළ ඇති වාක්‍යවලින් තෝරා අදාළ තිත් ඉ
ලියන්න.

(i) ගින් දාඩිය දැම්මා : ..............................................................

(ii) අබමල් රේණුවක් : ..............................................................

| වගකීමෙන් බේරීම / දැඩි සේ බියට පත් වීම / ඉටු නොවන සිහින මැවීම / ඉතා ම කුඩා ප්‍රමාණ |
|---|

7. පහත සඳහන් එක් එක් පුරුෂ ලිංග පදයට අදාළ ස්ත්‍රී ලිංග පදය ඉදිරියෙන් ලියන්න.

(i) රජ : ................................ (ii) නළුවා : ................................

8. යුගල පදය සම්පූර්ණ කරන්න. අහල ................................

9. පහත වචන නිවැරැදිව ගළපා වගන්තිය නැවත ලියන්න.

පියඹා /ගනියි / මල් පැණි / පුරවා / මී මැස්සා / බඩ / බී / මලින් මලට

........................................................................................................

10. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i)



| | | | | |
|---|---|---|---|---|
| | | | | |

(ii)



| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

[හතරවැනි පිටුව බලන්න.

Scanned with CamScanner

**11.** පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) before / our / wash / meals / We / hands

..............................................................................................................

(ii) to / Where / visit / you / like / do

..............................................................................................................

**12.** එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Shoes : ................................ (ii) Milk rice : ................................

**13.** 'වානම (வானம்)' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

..............................................................................................................

**14.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

ඔයාගේ අම්මාගේ නම මොකක් ද? : ..............................................................

**15.** පහත සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.


විසිතුන් දහස් හැත්තෑ පහ : ..............................................

**16.** කොටුව තුළ ඇති ඉලක්කම් යොදා ගෙන 7 ඉලක්කමෙන් නිරූපිත අගය 700 වන ඉලක්කම් හතරේ කුඩාම සංඛ්‍යාව ලියන්න.

| | |
|---|---|
| 5 | 9 |
| 7 | 2 |

: ..............................................

**17.** රූපයේ අඳුරු කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



: ..............................................

**18.** පහත සංඛ්‍යා ඇසුරෙන් පොදු අන්තරය 4 වන සංඛ්‍යා 5 කින් යුත් ආරෝහණ සංඛ්‍යා රටාවක් තිත් ඉරි මත ලියන්න.

| | | |
|---|---|---|
| 10 | 17 | 6 |
| 13 | | 9 |
| | 5 | 21 |

: ........, ........, ........, ........, ........

**19.** පලතුරුබීම 2 l 500 ml ක්, එකකට 500 ml බැගින් වන සේ බෝතල්වලට වත්කරන ලදි. අවශ්‍ය වූ මුළු බෝතල් ගණන කීය ද?

: ..............................................

**20.** රැස්වීම් ශාලාවක එක් පේළියකට 8 බැගින් වන ලෙස පුටු 400 ක් තබා තිබුණි. ශාලාවේ තිබූ පුටු පේළි ගණන කීය ද?

: ..............................................

**21.** නුවරඑළියෙන් ගමන් ආරම්භ කළ බස් රථයක් පැය 5 යි මිනිත්තු 20 කට පසුව ප.ව. 3.45ට කොළඹට පැමිණියේ ය. බස්රථය නුවරඑළියෙන් ගමන් ආරම්භ කළ වේලාව කීය ද?

: ..............................................

**22.** මගියකු 15 km 700 m ක දුරක් බසයෙන් ද 3 km 500 m ක දුරක් බයිසිකලයෙන් ද ගමන් කර ඇත. ඔහු ගමන් කළ මුළු දුර කොපමණ ද?

: .................. km .................. m

[පස්වැනි පිටුව බලන්න.

Scanned with CamScanner


23. ගඩොල් 1512 ක් තිබෙන ගොඩකින්, 721ක් ගෙන බැම්මක් බඳින ලදී. ඉතිරි වූ ගඩොල් සංඛ්‍යාව කීය ද?

: ..........................................


24. එක් මල්ලක හාල් 2 kg 500 g බැගින් වූ හාල් මලු 5ක ඇති හාල්වල මුළු බර කොපමණ ද?

: .................... kg .................... g

25. මෙම රූපයෙහි සමමිතික අක්ෂය අඳින්න.



26. වෙළඳසලක දිනකදී විකුණන ලද පලතුරු පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ඒ අනුව වගුවෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.




| පලතුර | විකුණූ ගෙඩි ගණන |
|---|---|
| පේර | 14 |
| දිවුල් | 07 |
| අඹ | .......... |
| කොමඩු | .......... |

27. විසඳන්න.

15 072 + 6 143 = ..........................................................

28. අමල් එකක් රුපියල් 75ක් බැගින් අඹ ගෙඩි 3ක් මිලදී ගත්තේ ය. මුදල් ගෙවීම සඳහා රුපියල් 500ක නෝට්ටුවක් ලබා දුන්නේ නම් ඔහුට ලැබෙන ඉතිරි මුදල කීය ද?

: ..........................................

29. ප්‍රාථමික පාසලක 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය තෙක් සිටින ළමුන් පිළිබඳ තොරතුරු පහත වගුවේ ඉදිරිපත් කර ඇත.

| ශ්‍රේණිය | පිරිමි ළමයි | ගැහැනු ළමයි |
|---|---|---|
| 1 | 22 | 15 |
| 2 | 18 | 20 |
| 3 | 17 | 17 |
| 4 | 23 | 21 |
| 5 | 19 | 21 |

මෙම පාසලේ සිටින ළමුන්ගෙන් ගැහැනු ළමයි සහ පිරිමි ළමයි සංඛ්‍යාව අතර වෙනස කීය ද?

: ..........................................

- අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

30. වසරේ එක් කාලයකට පමණක් පිපෙන මල් වර්ගයක් වන්නේ,
(1) දාස්පෙතියා ය. (2) ඉද්ද ය. (3) එරබදු ය.

31. වගාවට රසායනික පොහොර යෙදීම නිසා,
(1) පස සේදී යාමට පත් වේ.
(2) පසෙහි සිටින ජීවීන් ආරක්ෂා වේ.
(3) කෙටිකාලීනව සරු අස්වැන්නක් ලැබෙයි.


[හයවැනි පිටුව බලන්න.

Scanned with CamScanner

32. ලුණු සාර ආහාරයට එක් කරගැනීමෙන් ශරීරයට ලැබෙන පෝෂක පදාර්ථයක් වන්නේ,
(1) කාබෝහයිඩ්‍රේට ය. (2) විටමින් C ය. (3) අයඩින් ය.

33. ජනක්‍රීඩාවල ලක්ෂණයක් වන්නේ ඒවා සියල්ල
(1) විනෝදයට මෙන් ම එකමුතුකම සඳහා සිදුකිරීමයි.
(2) උපකරණ විශාල ප්‍රමාණයක් අවශ්‍ය ක්‍රීඩා වීමයි.
(3) එළිමහනේ පමණක් සිදුකළ හැකිවීමයි.

34. දැල්වෙන විදුලි පන්දමක්, ආධාරකයක සවිකළ බෝලයක් සහ බිත්තියක් කළුවර කාමරයක තැබිය හැකි අවස්ථා තුනක් A, B සහ C ලෙස දක්වා ඇත.



A B C

බිත්තිය මත විශාල ම සෙවනැල්ල ලැබෙන්නේ කුමන අවස්ථාවේදී ද?
(1) A (2) B (3) C

35. ළමය පාදය කුවාල සෑදීමට බලපාන එක් හේතුවක් වන්නේ පෝෂණ ඌනතාවකි. එම පෝෂකය කුමක් ද?
(1) විටමින් B (2) විටමින් D (3) කැල්සියම

36. සාමාන්‍ය තැපැල භාවිත කරමින් ලිපියක් යැවීමේ දී අනුගමනය කළ යුතු **අනිවාර්ය** අංගයක් වන්නේ,
(1) තම ප්‍රදේශයේ පිහිටි තැපැල් කාර්යාලයකින් පමණක් ලිපිය තැපැල් කිරීමයි.
(2) ලබන්නාගේ ලිපිනය ලියුම් කවරයේ නිවැරදිව සඳහන් කිරීමයි.
(3) යවන්නාගේ ලිපිනය ලියුම් කවරයේ නිවැරදිව සඳහන් කිරීමයි.


37. ගංවතුර ඇතිවීම සඳහා බලපාන සාධකයක් වන්නේ,
(1) විවිධ ශාක රෝපණය කිරීමයි.
(2) වැලි ගොඩ දැමීමයි.
(3) පහත් බිම් ගොඩ කිරීමයි.

38. ජලයේ වැවෙන නෙළුම් ශාකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඍජු හා දැඩි කඳක් තිබීම
(2) පත්‍ර මතුපිට ඉටිවැනි ස්වභාවයක් තිබීම
(3) කිසිදු කොටසක් ආහාරයට ගත නොහැකි වීම

39. සහනශීලී චර්යාවන් සහිත පුද්ගලයකුගේ දැකිය හැකි යහපත් ලක්ෂණයක් වන්නේ,
(1) ආවේගශීලීව ප්‍රතිචාර දැක්වීමයි.
(2) සැමවිට ම යටහත් වී නිශ්ශබ්දවීමයි.
(3) ආචාරශීලී වචන භාවිතයයි.

40. පලයක් හට ගැනීමේ දී ඉක්මණින් ම මැලවී යන්නේ මලේ කුමන කොටස ද?
(1) නටුව (2) මල් පෙති (3) මණිපත්‍ර

41. ගිරයක රූපයක් දක්වා ඇත. එහි කරකැවෙන ස්ථානය කුමක් ද?
(1) A
(2) B
(3) C




42. අතේ ඇඟිලිවල නියපොතු දිගට වැවීම නිසා,
(1) යමක් අල්ලා ගැනීම වඩා පහසුවෙයි.
(2) ඒවා තුළ විෂබීජ එකතුවීම ඉතා ම අවමවෙයි.
(3) තමාට මෙන් ම අන් අයට ද අනතුරු සිදුවෙයි.

[හත්වැනි පිටුව බලන්න.

Scanned with CamScanner


43. වී බීජ පාත්තිවල සිටුවීමට පෙර ගොවියකු විසින් අනුගමනය කළ පහත පියවර අතරින් නිවැරදි පියවර කුමක් ද?
   (1) බීජ ජලයට දමා පාවෙන බීජ ඉවත් කිරීම
   (2) දින තුනක් බීජ ජලයේ ගිල්වා තැබීම
   (3) ජලයේ ගිලී තිබූ බීජ දින දෙකක් හොඳින් වියළා ගැනීම

44. යම් පුද්ගලයකු දියට වැටුණු අවස්ථාවක ඔහු **නොකළ** යුතු දේ කුමක් ද?
   (1) හැකි තරම් දිය මතුපිට සිටීමට උත්සාහ කිරීම
   (2) දිය යට දී හොඳින් හුස්ම ගැනීමට උත්සාහ කිරීම
   (3) ජලයේ මතුපිට පාවෙන යමක් අල්ලා ගැනීමට උත්සාහ කිරීම

45. ශාක මුල් පිළිබඳ ව නිවැරදි වගන්තිය කුමක් ද?
   (1) සෑම ශාකයකට ම මුදුන් මුලක් තිබෙයි.
   (2) සෑම ශාකයක ම මුල් පසේ ගැඹුරට ම ගමන් කරයි.
   (3) මුල්වලින් පසේ ඇති ජලය සහ පෝෂක ශාකයට ලබා ගනියි.

46. ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන නැරඹීමට යාමේදී සිදු **නොකළ** යුතු ක්‍රියාව කුමක් ද?
   (1) චාරිකාවට පෙර එම ස්ථාන පිළිබඳ ව විස්තර හොයා බලා දැන ගැනීම
   (2) එම ස්ථානවල ඇති නටබුන් මත නම් සටහන් තැබීම
   (3) එම ස්ථානවල ඇති දැන්වීම් පුවරු කියවා එහි සඳහන් දේ පැහැදිලි කර ගැනීම

47. විදුලි පන්දම් බල්බ, වියළි කෝෂ සහ වයර් කැබලිවලින් සකස් කරන ලද I හා II විදුලි පරිපථ දෙකෙහි ම A යනු සූත්‍රිකාව දැවී ගිය බල්බයකි. මෙම පරිපථ පිළිබඳ නිවැරදි වගන්තිය කුමක් ද?



පරිපථය - I     පරිපථය - II

   (1) පරිපථය - I හි B බල්බය පමණක් දැල්වෙයි.
   (2) පරිපථය - II හි B බල්බය පමණක් දැල්වෙයි.
   (3) පරිපථ දෙකෙහි ම එක් බල්බයක්වත් නොදැල්වෙයි.

48. උෂ්ණත්වය අඩුවීමක් සිදුවන්නේ පහත කුමන අවස්ථාවේදී ද?
   (1) අයිස් ජලය බවට පත්වීම (2) ජලය වාෂ්ප බවට පත්වීම (3) ජලය අයිස් ලෙස ඝනවීම

49. යතුරු පැදි පැදවීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියාවක් වන්නේ,
   (1) ජංගම දුරකථනය භාවිත කරමින් යතුරුපැදිය පැදවීමයි.
   (2) යතුරුපැදියේ ගමන් කරන කුඩා දරුවන්ට ද හිස් ආවරණ පැළඳවීමයි.
   (3) ඉදිරියේ ධාවනය වන වාහන පසුකිරීම සඳහා හැකි පමණ වමපස යොදාගැනීමයි.

50. වැඩුණු සතකුගේ ශරීර ලක්ෂණවලට වඩා සම්පූර්ණ වෙනස් වූ රූපයකින් යුතු කුඩා අවධියක් සහිත සතකු වන්නේ,
   (1) බළලා ය.   (2) සමනළයා ය.   (3) එළුවා ය

51. ජලය 200 ml බැගින් සමාන වීදුරු බඳුන් දෙකකට දමා ඇත. ඉන් එක් බඳුනකට ලුණු කැට 20 g ක් ද අනෙකට ලුණු කුඩු 20 g ක් ද එක ම වේලාවේ දමා දියකරන ලදී. එහිදී,
   (1) ලුණු කුඩු ඉක්මනින් දියවෙයි.
   (2) ලුණු කැට ඉක්මනින් දියවෙයි.
   (3) ලුණු කැට හා කුඩු දියවීම සමාන කාලයකදී සිදුවෙයි.

52. සමාජයේ පුද්ගලයන්ගේ හැසිරීම් කිහිපයක් පහත දැක්වේ.
   A - යම් ආයතනයකින් සේවයක් ලබා ගැනීමේදී තම වාරය එනතෙක් සිටීම
   B - ප්‍රධාන මාර්ග පසින් ගමන් කරන විට වමපසින් ගමන් කිරීම
   C - භාවිතයෙන් පසු ජලකරාම හොඳින් වසා දැමීම

   ඉහත ලක්ෂණ අතුරෙන් වගකීම් සහගත පුද්ගලයකු තුළ දක්නට ලැබෙන යහපත් ලක්ෂණ වන්නේ
   (1) A හා B ය.   (2) A හා C ය.   (3) B හා C ය

53. නටන ජලයේ තැම්බෙන බිත්තරයක් සාමාන්‍ය ජලය සහිත කුඩා භාජනයකට දැමූවිට එම භාජනයේ ඇති ජලයේ උෂ්ණත්වය,
   (1) වැඩිවෙයි.   (2) අඩුවෙයි.   (3) වෙනස් නොවෙයි.


ලැබුණු මුළු ලකුණු

Scanned with CamScanner

54. සබන් සහ ජලය සහ ඔබ බටයක් උපයෝගී කරගෙන සාදා ගත හැකි බුබුළු සෑදීමට අවශ්‍ය නොවන්නේ,

(1) සබන් ය. (2) ජලය ය. (3) වාතය ය.

55. මේසයක් මත තබන ලද යකඩ ඇණයක් දෙසට ඈතින් සිට A, B සහ C යන දණ්ඩ චුම්බකයන් ළං කිරීමේදී එම යකඩ ඇණය ඇද ගැනීම සිදුවන දුර පහත දක්වා ඇත.




ඉහත ඒවා අතරින් චුම්බක ශක්තිය වැඩි ම චුම්බකය කුමක් ද?

(1) A (2) B (3) C

56. නිවසේ ඇති විවිධ උපකරණ පරිහරණයේදී සිදුකරන භාවිත පහත දැක්වේ.

A - නිවස අතුගෑමෙන් පසු කොස්ස බිත්ති මුල්ලක හේත්තු කර තැබීම

B - කෙනකුට පිහියක් දෙන විට ලබන්නාට මිට පැත්ත යොමු කිරීම

C - ඉරටු දෙපැත්තට භාවිතයට ගැනෙන ලෙප දෙපැත්ත මාරු කරමින් භාවිත කිරීම

ඉහත භාවිත අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.

57. පිරිසිදු, පෝෂ්‍යදායී සහ නැවුම් පලා වර්ග ආහාරයට ගැනීම සඳහා වඩාත් ම සුදුසු වන්නේ,

(1) බඳුන්වල හෝ ගෙවත්තේ හෝ පලා වර්ග වවා අවශ්‍යතා අනුව භාවිත කිරීමයි.

(2) දිනපතා වෙළඳපොළෙන් අවශ්‍ය පලා වර්ග මිලදී ගැනීමයි.

(3) සතියකට අවශ්‍ය පලා වර්ග එකවර මිලදී ගැනීමයි.

58. වනාන්තරයකට මාංශ භක්ෂක සතුන් විශාල ප්‍රමාණයක් පිටතින් ගෙනත් දැමීම නිසා සිදුවිය හැක්කේ,

(1) වනාන්තරයේ ශාක ක්‍රමයෙන් විනාශවීමයි.

(2) ශාක භක්ෂක සතුන්ගේ සංඛ්‍යාව බොහෝ වැඩිවීමයි.

(3) මාංශ භක්ෂක සතුන්ට ක්‍රමයෙන් ආහාර හිඟවීමයි.

59. ලෙඩ රෝගවලින් ආරක්ෂාවීම සඳහා පවත්වා ගත යුතු යහපත් පුරුද්දක් වන්නේ,

(1) පැණිරස හා ලුණු අධික ආහාර සීමා කිරීමයි.

(2) සතුන් විසින් කා දැමූ පලතුරු සෝදා ආහාරයට ගැනීමයි.

(3) කෙඳි සහිත වූ ආහාර භාවිතය අවම කිරීමයි.

60. පාසලේ පැවැත්වෙන පොත් ප්‍රදර්ශනය නැරඹීමට කුමුදිනි පැමිණෙන විටත් විශාල පිරිසක් එහි සිටින ආකාරය දක්නට ලැබුණි. කෙමෙන් ප්‍රදර්ශන කුටියක් තුළට ගිය කුමුදිනිගේ සිතට පුදුමයක් දැනුණි. ඊට හේතුව මෙතෙක් ඇය සොයන ලද පොත එහි දක්නට ලැබීමයි. කුමුදිනි එම පොත මිලදී ගත්තා. **සිදු කළ දේ පිළිබඳ විස්තර කෙරෙන වාක්‍ය තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට වඩා යුතු ය. උක්ත-ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

(1) ..............................................................................................................

..............................................................................................................

(2) ..............................................................................................................

..............................................................................................................

(3) ..............................................................................................................

Scanned with CamScanner